කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව

මහනුවර දිස්ත්‍රික්කය

------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

--------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පල්ලේකැලේ ජනසවිගම නිවාස ව්‍යාපෘතියට අදාළව ඉඩම් හෙක්ටයාර් 1.044 ක හා වෙනත් ඉඩම් 16 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සභාවේ ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.4,437,165 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, පල්ලෙකැලේ රජරූප අසල පොළ ඉදිකිරීමේ නිමි වටිනාකම රු.7,912,792 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) වටිනාකම රු.780,000 ක් වූ ට්‍රේලර් 05ක හා පරිත්‍යාගයක් ලෙස ලැබුණු ට්‍රේලරයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර, ට්‍රැක්ටරයක වටිනාකම රු.1,000,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු හා සභාවෙන් දරා තිබුණු රු.95,957,713 ක් වටිනාකම වූ ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කුණ්ඩසාලේ ආයුර්වේදයට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.133,075 ක වටිනාකම වූ යන්ත්‍ර හා උපකරණ ගිණුම්ගත කර නොතිබුණු අතර, රු.474,468 ක ඖෂධ තොගය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් තොගය තුළ භෞතිකව නොතිබුණු රු.4,837,105 ක ජල කර්මාන්ත ගබඩා තොගය හා කොම්පෝස්ට් පොහොර තොගයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණය රු.1,398,717 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ නොපියවූ අත්තිකාරම් රු.1,166,408 ක් පෙර ගෙවුම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමියෝ රු.2,406,955ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර, ගෙවිය යුතු රු.700,000 ක කර්මාන්ත ණයහිමි ශේෂ 2 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඒ) ලංකා බැංකුවේ පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු 4 කට අදාළව වාර්ෂික පොලිය රු.1,349,707 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

-----------------------

මොරගහපිටිය වෙළඳ සංකීර්ණයේ ටෙන්ඩර් ප්‍රදානය, ගොඩනැගිලි ඉදිකිරීම්, අනවසර ඉදිකිරීම් තහනම් කිරීම හා මාර්ග සම්බන්ධයෙන් සභාවට විරුද්ධව පාර්ශවකරුවන් 15 දෙනෙකු අධිකරණයේ පැවරූ නඩු සම්බන්ධව ගිණුම්වලින් අනාවරණය කර නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.9,575,292 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.416,267 ක වෙනසක් විය.

1.3.4 අවිනිශ්චිත ගිණුම්

--------------------

ඉකුත් වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණ අවිනිශ්චිත ගිණුමේ වූ රු.15,096 ක හර ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.15,239 ක හර ශේෂයක් වී තිබූ නමුත් එම අවිනිශ්චිත ශේෂය හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 3 ක එකතු වටිනාකම රු.52,150,392 ක් වූ අතර, එයින් වසර 1 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂයන්හි එකතුව රු.19,085,819 ක් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකම රු.45,741,869 ක් වූ අතර, එයින් වසර 1 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.13,137,564 ක් විය.

1.3.6 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.5,935,900 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | පනත් | |
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | (i) 19 (i) ඡේදය | අනුමැතියකින් තොරව සේවකයින් 12 දෙනෙකු බඳවාගෙන තිබූ අතර, එම සේවකයින්ට පත්වීම් ලිපි නිකුත් නොකර 2016 මැයි සිට ඔක්තෝබර් මාසය දක්වා සභා අරමුදලින් රු.1,110,500 ක වැටුප් ගෙවා තිබුණි. |

(ii) 19 (xi) වගන්තිය

ප්‍රාදේශීය සභාව සතු පල්ලෙකැලේ රජරුප අසල පර්චස් 2 ක හා පර්චස් 1 ක ඉඩම් කැබලි 2 ක් විධිමත් අනුමැතියක් හා කිසිදු ලිඛිත ගිවිසුමකින් තොරව ව්‍යාපාර කටයුතු සඳහා පුද්ගලයන් දෙදෙනෙකුට ලබාදී තිබුණි.

(iii) 149 වගන්තිය

සභා බල ප්‍රාදේශයේ පවතින හෝටලයකින් සියයට 1 දක්වා බදු මුදල ලබාගෙන නොතිබුණු අතර, හෝටල් 4 කින් විධිමත් ගිණුම් ලබා නොගෙන බදු අයකර තිබුණි.

(iv) 154 වගන්තිය

වෙන්දේසි කර තිබුණු ඉඩම් 4 කට අදාළව ඉඩම් අනු බෙදීම් අනුමත කිරීමේදී තාවකාලික ඇස්තමේන්තු මත සියයට 1 ක මුදල අයකර ගෙන තිබුණද ඉඩම් විකිණීම අවසන් වූ පසු සත්‍ය විකුණුම් වටිනාකම පරීක්ෂා කර ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) 219(1) වගන්තිය

හිටපු මන්ත්‍රීවරුන් 6 දෙනෙකු විසින් ඍජුව හා වක්‍රාකාරයෙන් සභාවේ කඩ කාමර 5 ක් හා ප්‍රාදේශීය සභා පැරණි ගොඩැගිල්ලේ ඉහළ මහලේ වර්ග අඩි 86.4 ක සහ 47.45 ක කාමර දෙකක් ලබාගෙන තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---------------------------------------

(i)මුදල් රෙගුලාසි 189

2010 වර්ෂය තුල කාලයට අදාල රු.76,599 ක් වටිනා අහරු චෙක්පත් 4 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ii)මුදල් රෙගුලාසි 756 (1)

2016 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2016 දෙසැම්බර් 7 දින දක්වාම ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ

------------------------------------

1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය හා 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන පළාත් පාලන චක්‍රලේඛය

-----------------------------------

| | |
|---|---|
| (i) 10 ඡේදය | (i) බදුකරුවන් විසින් කඩ කාමර අතුරු බදු දී කුලිය වරින් වර සංශෝධනය කරසභාවට ගෙවන කුලී මුදලට වඩා සියයට 90 ක ලාභ ලබමින් තිබුණද සභාව ඒ පිළිබඳව කටයුතු කර නොතිබුණි.<br><br>(ii) කඩ කාමර අතුරු බදු දීම සම්පූර්ණයෙන් තහනම් බව හා ඒ සම්බන්ධ උපදෙස් දී තිබියදීත්, ඇටර්නි බලපත්‍ර මඟින් කඩ කාමර හිමියන් 06 දෙනෙකු විසින් කඩ කාමර වෙනත් පුද්ගලයන්ට විකුණා රු.7,600,000ක මුදල් ලබාගෙන තිබුණි. |
| (ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 | ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම් නොකර හා විධිමත්ව ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව අවස්ථා 9 කදී රු.1,116,300ක් වටිනා මිලදී ගැනීම් සිදු කර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.56,976,713 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.94,887,182 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.37,910,469 ක පහත වැටීමක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.37,910,469 ක පහත වැටීමට ආදායම් විෂයයන් 2 ක රු.28,082,062ක අඩුවීම හා වියදම් විෂයයන් 3 ක රු.5,947,812 ක වැඩිවීම මූලික වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

---------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 2 ක මුළු ජංගම වත්කම් හා මුළු ජංගම වගකීම් අතර, අනුපාතය පිළිවෙලින් 1.7:1, 1.27:1 සහ 1:0.7 ක් විය.

2.4 ආදායම් පරිපාලනය

-----------------------

2.4.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු වෙළඳ සංකීර්ණ 3 ක කඩ කාමර 15 ක් 2010 වර්ෂයේ සිට බදු දීමේදී ඇතැම් බදුකරුවන්ගෙන් එකවර ගෙවීමේ මුදල් අයකර නොතිබීම හේතුවෙන් යතුරු භාරදී නොතිබුණි. කාමර ලබා නොගන්නේ නම් නැවත ටෙන්ඩර් කර සභාවේ දේපල වලින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ආදායමද අහිමි වී තිබුණි.

(ආ) සභාව සතු වත්කම් බදු දීමේදී තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවාගෙන තිබුණද, තක්සේරු බදු කුලිය අය නොකර සභා තීරණ මත කඩ කුලී අය කිරීමෙන් සභා අරමුදලට පාඩු සිදුවී තිබුණි.

(ඇ) වරිපනම් බදු වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත්, 2007 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත 2016 වර්ෂය දක්වාම වරිපනම් අය කිරීම හේතුවෙන් සැලකිය යුතු ආදායමක් සභා අරමුදලට අහිමි වී තිබුණි.

2.4.2 වරිපනම්

-----------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.5,935,770 ක හිඟ ශේෂයක් පැවතියද වර්ෂය තුළ ඉන් අයකරගෙන තිබුණේ රු.2,989,421 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 50 ක අගයක් විය.

(ආ) සභා බල ප්‍රදේශයේ ඇති රජයේ ආයතන වලින් අයවිය යුතු රු.1,078,912 ක වරිපනම් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.4.3 බදු කුලී

----------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.3,029,884 ක හිඟ ශේෂයෙන් අයකර තිබුණේ රු.1,706,647 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 56 ක් වූ අතර,වර්ෂයේ බිල් කිරීම් වලින්ද අයකර තිබුණේ සියයට 66 ක් පමණි.

2.4.4 වෙනත් ආදායම්
-------------------

(අ) ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු
----------------------------------
සමාලෝචිත වර්ෂයේ ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු බිල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර, 2016 ජනවාරි 1 දිනට පැවැති හිඟයෙන් රු.1,775,449 ක මුදලක් අයවිය යුතුව පැවතුණි.

(ආ) සම්ප්‍රේෂණ කුළුණු සඳහා බදු
---------------------------------
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුළ ඇති සම්ප්‍රේෂණ කුළුණු වලින් බදු අය කළ යුතු වුවත්, 2015 සහ 2016 වර්ෂ වලදී රු.48,000 ක බදු ආදායමක් අය කරගෙන නොතිබුණි.

(ඇ) කසල බදු
-----------
සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.1,359,743 ක කසල බදු ශේෂයෙන් අයකර තිබුණේ රු.547,900 ක් පමණි. එය හිඟයෙන් සියයට 40 ක් පමණි. වර්ෂයේ බිල්කිරීම් වලින්ද අයකර තිබුණේ සියයට 48 ක් පමණි.

(ඈ) අක්කර බදු
--------------
සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.39,780 ක හිඟ ශේෂයක් පැවතියද වර්ෂය තුළ ඉන් අයකර තිබුණේ රු.4,109 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 10 ක අගයක් විය.

2.4.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ වෙනුවෙන් රු.730,000 ක් සහ මුද්දර ගාස්තු රු.55,676,063 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------
3.1 කාර්යසාධනය
-----------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ ඉදිකර තිබුණු දිගන වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ කඩ කාමර 4 ක් 2017 මාර්තු 31 දින වන විටද නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිත ගල්පිහිල්ල ආදාහනාගාරය, නිවාඩු නිකේතනය ඉදිකිරීම හා ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් ඉහල නැංවීම ප්‍රාදේශීය සභාවකින් ඉටු විය යුතු වගකීමක් වුවද, කාණු පද්ධති පිරිසිදු කිරීම, කුණු කසල ඉවත් කර නගර පිරිසිදුව තබා ගැනීම වැනි කටයුතු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු වී නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ මිලදීගෙන තිබුණු ඡායා පිටපත් යන්ත්‍රයක් අළුත්වැඩියාව සඳහා එය මිලදී ගත් ආයතනයටම 2008 වර්ෂයේදී ලබා දී තිබුණද, අළුත්වැඩියා කර ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර නොතිබුණි.

(ආ) 1999 හා 2010 වර්ෂ අතර අවස්ථා 42 කදී තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ තැන්පත් රු.299,787 ක් සම්බන්ධයෙන් පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අවස්ථා 108 කදී ජංගම ගිණුමට බැර වීම් පිළිබඳ විස්තර නොමැති රු.622,564ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අවස්ථා 54 කදී ජංගම ගිණුමට හර වී තිබූ විස්තර නොමැති රු.929,753 ක මුදල හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මොරගහපිටියවත්ත හා දිගන වෙළඳ සංකීර්ණවල තක්සේරු කුලියට වඩා අඩු බදු මුදලක් අයකර තිබුණු බැවින් 2015 හා 2016 නොවැම්බර් දක්වා කාලය තුළ සභාවට රු.7,787,500 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) 2016 නොවැම්බර් 30 දින වන විටදිගන හා මොරගහපිටිය වෙළඳසංකීර්ණ වල කඩ කාමර වලින්රු.1,612,965 ක මුදලක් හිඟව පැවතුණි.

(ඇ) කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නව ව්‍යාපාරික ස්ථාන සඳහා ගොඩනැගිලි සැලසුම් අනුමත වී වසර 3 ක් ඉක්ම ගොස් ඇති වාණිජ ගොඩනැගිලි 45 ක් සඳහා තාවකාලික තක්සේරුවක් මත හෝ වරිපනම් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාවේ අවසරයක් නොමැතිව කඩ කාමර බදු ගැනුම්කරුවන් බදු දේපලෙහි ව්‍යුහය වෙනස් කිරීම හා බදු දේපලට අලුතින් කොටස් එකතු කිරීම සිදු කර තිබුණු අවස්ථා තිබුණි.

(ඉ) සභා කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 12 ක සේවක පුරප්පාඩු 13 ක් සහ අතිරික්තතා 42 ක් විය.

(ඊ) පල්ලෙකැලේ ඉදිකල සතිපොල බදු දීමේදී ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව 2013 දෙසැම්බර් 26 දින මහා සභා අනුමැතිය මත අවිධිමත් පදනමකින් බදුකරුවන් තෝරාගෙන බදු දී රු.4,950,000 ක මුදලක් අයකරගෙන තිබුණි. 2016 ජූනි මාසයෙන් පසු පොළ ක්‍රියාත්මක තත්වයේ නොතිබුණි.

(උ) මොරගහපිටිය වෙළඳ සංකීර්ණයේ අංක 27 හා 28 කඩ බදු දීමෙන් එකවර ලැබිය යුතු රු.1,510,000 ක මුදල වෙනුවට රු.200,000 ක් පමණක් අයකර 2016 මාර්තු මාසයේදී ගත් සභා තීරණයක් මත එම මුදල ආපසු ගෙවා තිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

ප්‍රාදේශීය සභාව සතු පොදු කටයුතු සඳහා ලැබී තිබුණු පල්ලේකැලේ රජරුප අසල පිහිටි පර්චස් 20 ක පමණ ඉඩම් කොටස කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අනාරක්ෂිතව පැවතුණි.

3.5 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

---

පොදු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරා දිය යුතු ඉඩම් කොටසට මුදල් ගෙවීම් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබියදී මහ සභා තීරණයක් අනුව ඒ සඳහා මුදල් ගෙවීමට අනුමැතිය ලබා දී ඉඩම සඳහා නිවාස සංවර්ධන අධිකාරිය විසින් ගෙවන ලෙස දැන්වූ රු.4,923,640 ක මුළු මුදලින් සියයට 25 ක් වන රු.1,230,910 ක මුදල සභා අරමුදලින් ගෙවා තිබුණි.

3.6 ආර්ථික නොවූ ගනුදෙනු

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය සතු 2012 වසරේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට ලබා දී තිබූ ඩිපෙන්ඩර් රථයේ බාහිර හා අභ්‍යන්තර අළුත්වැඩියාවන් සඳහා 2013 වසරේ රු.2,150,000 ගෙවා තිබූ නමුත් අළුත්වැඩියාවෙන් පසු වාහනය ධාවනයේ යෙදවීමෙන් තොරව කාර්යාලයේ ඉදිරිපිට ගාල් කර තිබීමෙන් ඒ සඳහා වැය කළ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ආ) පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මඩවල පිහිටි මස් කඩය ඉකුත් වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල රු.2,500,000 කට බදු ගත් බදුකරු විසින් ඒ අසලම කුණ්ඩසාලේ ප්‍රාදේශීය

සහා බල ප්‍රදේශයේ ඉදිකල පෞද්ගලික මස් කඩයක ටකුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් අවසර දීමෙන් රු.2,500,000ක ආදායමක් අහිමි වී තිබුණි.

3.7 හඳුනාගත් අලාභ

--------------------

2014 භාණ්ඩ සමීක්ෂණයේදී ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ හා ගබඩාවේ සමීක්ෂණය සඳහා ඉදිරිපත් නොකළ භාණ්ඩ අයිතම 426 ක් සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 08 දින දක්වාම ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

3.8 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

(අ) පල්ලේකැලේ රජරුප අසල පොළ ඉදිකිරීම

------------------------------------------------

(i) ප්‍රාදේශීය සභා අරමුදල්, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා ටෙන්ඩර් ලාභීන්ගෙන් එකතු කල මුදල්, යන ප්‍රතිපාදන උපයෝගී කරගෙන කුණ්ඩසාලේ ගම්උදා භූමියේ රජ රුප අසල පිහිටා ඇති ඉඩමේ රු.9,080,564 ක් වැයකර පොළක් ඉදිකර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණු අතර, ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව කර්මාන්තය ඉටු කිරීමට සමිති 03 ක් සමඟ අදියර 7ක් යටතේ ගිවිසුම්ගතව තිබුණි. මෙම ඉදිකිරීම සඳහා ඉංජිනේරුවරයකුගේ අනුමැතියකින් තොරව තාක්ෂණ නිලධාරී විසින් රු.7,742,113 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබු නමුත්, ඇස්තමේන්තුව ඉක්මවා රු.1,338,451 ක් ගෙවීම් කර තිබුණි.

(ii) ඇස්තමේන්තුව, ගෙවීම් වාර්තා, මිනුම් හා භෞතික පරීක්ෂාවේදී වැඩ විෂයය අංක 16 යටතේ 1" හා 1/2 බට භාවිතා කර වහලය නිම කිරීමට කාප්ප 24 ක් සඳහා රු.947,136 ක් ගෙවා තිබූ නමුත්, භෞතික පරීක්ෂාවේදී කාප්ප 17 ක් තිබූ අතර, එහි වටිනාකම රු.670,888 ක් තිබූ බැවින් කාප්ප 7 ක් සඳහා රු.276,248 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.වැඩ විෂයය අංක 17 යටතේ 1 ½"x 1 ½" 3 mm බොක්ස් බාර් මීටර් 828.35 ක් සවිකර තිබූ බවට රු.536,729 ක් ගෙවා තිබූ නමුත් භෞතික පරීක්ෂාවේදී බොක්ස් බාර් මීටර 567.35 ක් පමණක් තිබූ බැවින් මීටර 261ක් වෙනුවෙන් රු.168,867ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) ඉහලවෙල වසමේ පංචපිටිය පාර සංවර්ධනය කිරීම

--------------------------------------------------------

2016 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ යථෝක්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.416,346 ගෙවීම් කර තිබුණි. මෙම මාර්ගය පිළිබඳව සිදුකළ Rebound hammer test පරීක්ෂණ වාර්තාව අනුව කොන්ක්‍රීට් මිශ්‍රණයේ

ශක්තිය 20 ට අඩු මට්ටමක පැවතීම හේතුවෙන් කොන්ක්‍රීට් මිශ්‍රණය නියමිත ප්‍රමිතියෙන් තොර වූ අතර, මාර්ගයේ ස්ථාන 3ක කොන්ක්‍රීට් ස්ථරයේ ඝනකම විවිධ ප්‍රමාණයන්ගෙන් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුවේ වැඩ විෂයය 2 ප්‍රකාරව 1:2:4(19mm) ප්‍රමාණයට ඝනමීටර 3090 කට කොන්ක්‍රීට් යෙදිය යුතු වුවද, 2017 මාර්තු 31 දින සිදුකළ පරීක්ෂාවේදී එම ප්‍රමාණයෙන් කොන්ක්‍රීට් යොදා නොතිබුණි.

(ඇ) කුණ්ඩසාලේ රංසිරිගම වැසි ජලය බැස යාම සඳහා රුක්මල්ඔය දක්වා කාණු පද්ධතිය සකස් කිරීම

---

2016 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඌන සංවර්ධිත /හුදෙකලා ගම්මාන වැඩසටහන යටතේ පල්ලේකැලේ දෙවන යුධ හමුදා මූලස්ථාන සේනාංකයට කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.997,448 ක වටිනාකම වූ ඉදිකිරීම් ද්‍රව්‍ය 2016 නොවැම්බර් 16 දිනලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2017 මාර්තු 31 දින පරීක්ෂාවේදී ව්‍යාපෘතියේ වැඩ සියයට 75 ක් පමණ අවසන් කර තිබුණු අතර, මේ සඳහා ලබා දුන් සිමෙන්ති මිටි (kg 50) 145, මැටල් කියුබ් 1¼ හා ගල් 6 x 9 කියුබ් 6 ක ඉදිකිරීම් ද්‍රව්‍ය හමුදා පරිශ්‍රයේ රඳවාගෙන තිබුණි.

(ඈ) මාර්ග කොන්ක්‍රීට් කිරීම

---

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් විවිධ ප්‍රතිපාදන මත සංවර්ධනය කර තිබුණු මාර්ගවල වැඩ නිමකිරීමෙන් පසු Rebound hammer test පරීක්ෂණ වාර්තාව අනුව කොන්ක්‍රීට් මිශ්‍රණයේ ශක්තිය 20 ට අඩු මට්ටමක පැවතීම හේතුවෙන් කොන්ක්‍රීට් මිශ්‍රණය නියමිත ප්‍රමිතියෙන් තොර වුවත්, කොන්ක්‍රීට් මිශ්‍රණය දූර්වලමාර්ග 5 ක් සඳහා රු.2,245,534ක් ගෙවීම් කර තිබුණි.

## 3.9 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---

ජපන් රජයේ මූල්‍ය පරිත්‍යාගයක් යටතේ 2015 වර්ෂයේදී ජයිකා ආයතනය මඟින් රු.100,000,000 ක් වටිනාකමින් යුත් ස්වයංක්‍රීය ස්වායු තාක්ෂණික කාබනික පොහොර නිෂ්පාදන කර්මාන්තයක් කුණ්ඩසාලේ හා පාතදුම්බර ප්‍රාදේශීය සභා සඳහා ලබා දී තිබූ නමුත්, නිෂ්පාදනය කරන පොහොර ප්‍රමාණයට සරිලන පොහොර හැලීමට හැකි යන්ත්‍රයක් 2017 මාර්තු 31 දින දක්වාම ලබා දී නොතිබුණු බැවින් ව්‍යාපෘතියේ සාර්ථකත්වයට එය බාධාවක් වී පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී පොහොර කි.ග්‍රෑ. 15150 ක් නිෂ්පාදනය කර තිබූ නමුත් විකිණීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යොදා නොගන්නා නොදිරන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණයට යොමු නොකර පරිසරයට හානිවන අයුරින් බැහැර කර තිබුණි.

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
---------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයයන් 39 ක් සඳහා වෙන්කළ රු.110,625,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 06 ක් සඳහා ඇස්තමේන්තුගත රු.425,000 ක ආදායමෙන් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු
---------------------------------------

සභාවේ විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුල කමිටු රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි.

05. පද්ධති හා පාලනයන්
------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය

(ඇ) මුදල් හා බැංකු කටයුතු

(ඈ) වාහන පාලනය

(ඉ) ආදායම් පාලනය

(ඊ) ණයගැතියෝ සහ ණයහිමියෝ

(උ) කොන්ත්‍රාත් පාලනය